# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2021 දෙසැම්බර් මස 24 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2021.12.27 දින නිකුත් කරන ලදී)**


# අසභ්‍ය ප්‍රකාශන තහනම් කිරීමේ

**අසභ්‍ය වූ යම් ද්‍රව්‍යයක්, වස්තුවක් හෝ දෙයක් ප්‍රකාශයට පත් කිරීම, බෙදා හැරීම, විකිණීම, ආනයනය කිරීම සහ අපනයනය කිරීම තහනම් කිරීම සඳහා ද; (30 වන අධිකාරය වූ) අසභ්‍ය ප්‍රකාශන ආඥාපනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද පනත් කෙටුම්පතකි**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 36.00** | **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## අසභ්‍ය ප්‍රකාශන තහනම් කිරීමේ

එල්.ඩී.-ඕ. 21/2007

**අසභ්‍ය වූ යම් ද්‍රව්‍යයක්, වස්තුවක් හෝ දෙයක් ප්‍රකාශයට පත් කිරීම, බෙදා හැරීම, විකිණීම, ආනයනය කිරීම සහ අපනයනය කිරීම තහනම් කිරීම සඳහා ද; (30 වන අධිකාරය වූ) අසභ්‍ය ප්‍රකාශන ආඥාපනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2021 අංක දරන අසභ්‍ය ප්‍රකාශන තහනම් කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

I වන කොටස

**පනත අදාළ වීම**

**2.** මේ පනතේ විධිවිධාන - පනත අදාළ වීම

(අ) වරද සිදු කරන තැනැත්තා ශ්‍රී ලංකාව තුළ සිටින්නේ ද නොසිටින්නේ ද යන්න නොතකා, මේ පනත යටතේ වරදක් සංයුක්ත වන යම් ක්‍රියාවක් ශ්‍රී ලංකාව තුළ සිදුවන අවස්ථාවක දී;

(ආ) යම් තැනැත්තකු ශ්‍රී ලංකාව තුළ සිටින අතරතුර දී, ඒ තැනැත්තා විසින් මේ පනත යටතේ වූ වරදක් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන අවස්ථාවක දී; හෝ

(ඇ) මේ පනත යටතේ වූ වරදක්, කවර ස්ථානයක සිදු කරනු ලැබූව ද, එය ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන තැනැත්තකු විසින් සිදු කරනු ලබන අවස්ථාවක දී,

අදාළ විය යුතු ය.

## II වන කොටස

### අසභ්‍ය ප්‍රකාශන

අසභ්‍ය වූ ද්‍රව්‍යයක්, වස්තුවක් හෝ දෙයක් ප්‍රකාශයට පත් කිරීම ආදිය වරදක් බව

**3.** (1) යම් තැනැත්තකු විසින්-

(අ) අසභ්‍ය වූ යම් ද්‍රව්‍යයක්, වස්තුවක් හෝ දෙයක් ප්‍රකාශයට පත් කිරීම, ප්‍රදර්ශනය කිරීම, කුළියට දීම, විකිණීම, විකිණීමට ඉදිරිපත් කිරීම, බෙදා හැරීම හෝ යම් සන්නිවේදන මාධ්‍යයක් හරහා යම් ආකාරයකින් සංසරණය වීම සඳහා ඉදිරිපත් කිරීම;

(ආ) (අ) ඡේදයේ දක්වා ඇති යම් කාර්යයක් සඳහා, අසභ්‍ය වූ යම් ද්‍රව්‍යයක්, වස්තුවක් හෝ දෙයක් ආනයනය කිරීම, අපනයනය කිරීම, සෑදීම, නිපදවීම, මුද්‍රණය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, ප්‍රවාහනය කිරීම, සන්තකයේ තබා ගැනීම හෝ ඒ සම්බන්ධයෙන් කවර හෝ වෙනත් යම් ක්‍රියාවක් කිරීම; හෝ

(ඇ) (i) අසභ්‍ය වූ යම් ද්‍රව්‍යයක්, වස්තුවක් හෝ දෙයක් ලබා ගැනීම සඳහා ඇති බවට; හෝ

(ii) මේ පනත යටතේ වරදක් සංයුක්ත වන යම් ක්‍රියාවක දී භාවිත කිරීමට යම් තැනැත්තකුගේ සේවය ලබා දිය හැකි බවට හෝ එවැනි සේවයක් අවශ්‍ය බවට,

ප්‍රචාරණය කිරීම, යම් සන්නිවේදන මාධ්‍යයකට හෝ යම් ප්‍රචාරණයකට ඉදිරිපත් කිරීමට බලය ලබා දීම හෝ අවසර ලබා දීම හෝ වෙනත් කවර හෝ ආකාරයකින් ප්‍රසිද්ධියට පත් කිරීම,

සිදු කරනු නොලැබිය යුතු ය.

(2) නීත්‍යානුකූල හේතුවක් නොමැතිව, (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට වසර දහයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් විසිපත් දහසකට නොඅඩු

දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු අතර, දෙවන වරට හෝ තදනන්තරව වරදකරු කරනු ලැබූ විට, වසර විස්සක් දක්වා දීර්ඝ විය හැකි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂයකට නොඅඩු දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

## III වන කොටස

### ළමයින් සම්බන්ධයෙන් වන අසභ්‍ය ප්‍රකාශන

අසභ්‍ය ද්‍රව්‍ය ආදියට ළමයින් නිරාවරණය කිරීම ආදිය වරදක් බව

4. (1) යම් තැනැත්තකු විසින් -

(අ) අසභ්‍ය වූ යම් ද්‍රව්‍යයකට, වස්තුවකට හෝ දෙයකට ළමයකු නිරාවරණය කිරීම හෝ එවැන්නක් ළමයකුට ලබා ගැනීමට සැලසීම; හෝ

(ආ) (අ) ඡේදයේ දක්වා ඇති යම් කාර්යයක් සඳහා අසභ්‍ය වූ සහ ළමයකු, ළමයකු ලෙස පෙනෙන තැනැත්තකු හෝ ළමයකු නිරූපණය වන තාත්වික ප්‍රතිබිම්බයක් දෘශ්‍යමානව පෙන්නුම් කරන්නා වූ යම් ද්‍රව්‍යයක්, වස්තුවක් හෝ දෙයක් ආනයනය කිරීම, අපනයනය කිරීම, සෑදීම, නිපදවීම, මුද්‍රණය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, ප්‍රවාහනය කිරීම හෝ යම් මාධ්‍යයකින් තම සන්තකයේ තබා ගැනීම හෝ ඒ සම්බන්ධයෙන් කවර හෝ වෙනත් යම් ක්‍රියාවක් කිරීම,

සිදු කරනු නොලැබිය යුතු ය.

(2) නීත්‍යානුකූල හේතුවක් නොමැතිව, (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට වසර පහකට නොඅඩු සහ වසර දහයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ දෙකකට නොඅඩු දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු අතර, දෙවන වරට හෝ තදනන්තරව වරදකරු කරනු ලැබූ විට, වසර හයකට නොඅඩු සහ වසර විස්සක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ පහකට නොඅඩු දඩයකට යටත් විය යුතු ය.

අසභ්‍ය වූ සහ ළමයකු ලිංගික කාර්යය ප්‍රකාශ වන හැසිරීමක යෙදී සිටීම දෘශ්‍යමානව පෙන්නුම් කරන්නා වූ යම් ද්‍රව්‍යයක් ආදිය ප්‍රකාශයට පත් කිරීම ආදිය වරදක් බව

**5.** (1) යම් තැනැත්තකු විසින්-

(අ) අසභ්‍ය වූ සහ ළමයකු, ළමයකු ලෙස පෙනෙන තැනැත්තකු හෝ ළමයකු නිරූපණය වන තාත්වික ප්‍රතිබිම්බ, ලිංගික කාර්යය ප්‍රකාශ වන හැසිරීමක යෙදී සිටීම දෘශ්‍යමානව පෙන්නුම් කරන්නා වූ යම් ද්‍රව්‍යයක්, වස්තුවක් හෝ දෙයක් ප්‍රකාශයට පත් කිරීම, ප්‍රදර්ශනය කිරීම, කුලියට දීම, විකිණීම, විකිණීමට ඉදිරිපත් කිරීම, බෙදා හැරීම හෝ යම් සන්නිවේදන මාධ්‍යයක් හරහා යම් ආකාරයකින් සංසරණය වීම සඳහා ඉදිරිපත් කිරීම; හෝ

(ආ) (අ) ඡේදයේ දක්වා ඇති යම් කාර්යයක් සඳහා අසභ්‍ය වූ සහ ළමයකු, ළමයකු ලෙස පෙනෙන තැනැත්තකු හෝ ළමයකු නිරූපණය වන තාත්වික ප්‍රතිබිම්බ, ලිංගික කාර්යය ප්‍රකාශ වන හැසිරීමක යෙදී සිටීම දෘශ්‍යමානව පෙන්නුම් කරන්නා වූ යම් ද්‍රව්‍යයක්, වස්තුවක් හෝ දෙයක් ආනයනය කිරීම, අපනයනය කිරීම, සෑදීම, නිපදවීම, මුද්‍රණය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, ප්‍රවාහනය කිරීම හෝ යම් සන්නිවේදන මාධ්‍යයකින් තම සන්තකයේ තබා ගැනීම හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් කවර හෝ යම් ක්‍රියාවක් කිරීම,

සිදු කරනු නොලැබිය යුතු ය.

(2) නීත්‍යානුකූල හේතුවක් නොමැතිව, (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට-

(අ) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන විට, වසර තුනකට නොඅඩු සහ වසර විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ තුනකට නොඅඩු දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු අතර, දෙවන වරට හෝ තදනන්තරව වරදකරු කරනු ලැබූ විට, වසර තුනකට නොඅඩු සහ වසර විස්සක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ පහකට නොඅඩු දඩයකට යටත් විය යුතු ය; සහ

(ආ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන විට, වසර දෙකකට නොඅඩු සහ වසර දහයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ දෙකකට නොඅඩු දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු අතර, දෙවන වරට හෝ තදනන්තරව වරදකරු කරනු ලැබූ විට, වසර දෙකකට නොඅඩු සහ වසර විස්සක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ පහකට නොඅඩු දඩයකට යටත් විය යුතු ය.

IV වන කොටස

**පරිගණක පද්ධති භාවිත කිරීම මගින් වූ ළමයින් සම්බන්ධ කාමෝද්දීපන දර්ශන**

**6.** (1) යම් තැනැත්තකු විසින් -

ළමයින් සම්බන්ධ කාමෝද්දීපන දර්ශන පරිගණකයක් හරහා ලබා ගැනීමට සැලැස්වීම වරදක් බව

(අ) තමා සඳහා හෝ වෙනත් යම් තැනැත්තකු සඳහා පරිගණක පද්ධතියක් භාවිත කරමින් ළමයින් සම්බන්ධ කාමෝද්දීපන දර්ශන නිපදවීම, ලබා ගැනීමට සැලැස්වීම, යම් ආකාරයකින් ඉදිරිපත් කිරීම, බෙදාහැරීම, සම්ප්‍රේෂණය කිරීම හෝ ලබා දීම;

(ආ) පරිගණකයක හෝ පරිගණක දත්ත ගබඩා කිරීමේ මාධ්‍යයක ළමයින් සම්බන්ධ කාමෝද්දීපන දර්ශන සන්තකයේ තබාගැනීම හෝ රඳවා තබා ගැනීම;

(ඇ) පරිගණයක් මගින් යම් අසභ්‍ය වූ සහ ලිංගික කාර්යය ප්‍රකාශ වන ද්‍රව්‍යයකට, වස්තුවකට හෝ දෙයකට, ළමයකු නිරාවරණය කිරීම; හෝ

(ඈ) ළමයින් සම්බන්ධ කාමෝද්දීපන දර්ශන සඳහා පරිගණක පද්ධතියක් මගින් ප්‍රවේශය ලබා ගැනීම,

සිදු කරනු නොලැබිය යුතු ය.

(2) නීත්‍යානුකූල හේතුවක් නොමැතිව, (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, එසේ වරදකරු කරනු ලැබූ විට අවුරුදු දහයක් නොඉක්මවන

කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(3) (අ) පරිගණකයක් මගින් සේවාවක් සපයන යම් තැනැත්තකු විසින්, එකී සේවාව භාවිත කිරීම මගින් ළමයකුට අසභ්‍ය වූ සහ ලිංගික කාර්යය ප්‍රකාශ වන ද්‍රව්‍යයකට, වස්තුවකට හෝ දෙයකට ප්‍රවේශ විය නොහැකි වන බවට වග බලාගනු ලැබිය යුතු ය.

(ආ) නීත්‍යනුකූල හේතුවක් නොමැතිව, මේ උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙකු වරදක් සිදු කරන අතර, එසේ වරදකරු කරනු ලැබූ විට අවුරුදු දහයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(ඇ) ඒ සේවාව භාවිත කරන යම් ළමයකු ලිංගික කාර්යය ප්‍රකාශ වන ද්‍රව්‍යයකට, වස්තුවකට හෝ දෙයකට ප්‍රවේශය ලබා ගැනීමෙන් වැළැක්වීම සඳහා, ඒ තැනැත්තා විසින් සියලු සාධාරණ ක්‍රියාමාර්ග ගනු ලැබූ බවට ඔප්පු කිරීම, මේ උපවගන්තිය යටතේ වූ වරදකට චෝදනා ලැබ සිටින තැනැත්තකුට විත්ති වාචකයක් විය යුතු ය.

(4) (අ) යම් තැනැත්තකු විසින්, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය මගින්, ලිංගික ක්‍රියාකාරකම්වල නිරතවීම පිණිස ළමයකු හමුවීම සඳහා හෝ ළමයින් සම්බන්ධ කාමෝද්දීපන දර්ශන නිපදවීම සඳහා හෝ යෝජනා කිරීම සිදු කරනු නොලැබිය යුතු ය.

(ආ) නීත්‍යනුකූල හේතුවක් නොමැතිව, මේ උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, එසේ වරදකරු කරනු ලැබූ විට අවුරුදු දහයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට සහ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්යය සඳහා -

"ළමයින් සම්බන්ධ කාමෝද්දීපන දර්ශන" යන්නෙන්, අසභ්‍ය වූ සහ ළමයකු, ළමයකු ලෙස පෙනෙන තැනැත්තකු හෝ ළමයකු නිරූපණය වන තාත්වික ප්‍රතිබිම්බ සැබෑ ලෙස හෝ අනුකාරක

ලෙස ලිංගික කාර්යය ප්‍රකාශ වන හැසිරීමක යෙදී සිටීම දෘශ්‍යමානව පෙන්නුම් කරන්නා වූ යම් ද්‍රව්‍යයක්, වස්තුවක් හෝ දෙයක් හෝ මූලික වශයෙන් ලිංගික කාර්ය සඳහා ළමයකුගේ ලිංගික අවයවයන් පෙන්නුම් කරන යම් නිරූපණයක් අදහස් වේ;

"පරිගණක පද්ධතිය" යන්නෙන්, යම් පද්ධතියක හෝ උපාංගයක අන්තර්ගත වැඩසටහනකට අනුව ස්වයංක්‍රීයව දත්ත සැකසීම සිදු කරන උපාංගයක් හෝ එකක් හෝ වැඩි ගණනකින් සමන්විත වන අන්තර් සම්බන්ධතාවයකින් යුතු හෝ එසේ සම්බන්ධිත යම් උපාංග සමූහයක් අදහස් වේ;

"සේවාව" යන්නට වාණිජ පදනමක් මත හෝ අධ්‍යාපනික ආයතනයක් විසින් හෝ යම් පොදු ස්ථානයක් මගින් සපයනු ලබන, ළමයින්ට පරිගණකයක් වෙත ප්‍රවේශ විය හැකි සේවාවක් ඇතුළත් වේ; සහ

"ගබඩා කිරීමේ මාධ්‍යය" යන්නෙන් වෙනත් යම් ද්‍රව්‍යයක හෝ උපාංගයක ආධාර සහිතව හෝ රහිතව තොරතුරු වෙත ප්‍රවේශ වීමේ සහ නැවත ලබා ගැනීමේ හැකියාව ඇති යම් ඉලෙක්ට්‍රොනික හෝ ඒ හා සමාන උපාංගයක් අදහස් වේ.

## V වන කොටස

### විමර්ශනය

විමර්ශනය

**7.** මේ පනතේ අන්‍යාකාරයකට විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ පනත යටතේ වන සියලු වැරදි විමර්ශනය කිරීම, විභාග කිරීම හෝ ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සුදුස්සක් කිරීම, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට අනුකූලව කරනු ලැබිය යුතු ය.

විශේෂඥයන් සහ ඔවුන්ගේ බලතල සහ කර්තව්‍ය

**8.** (1) මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන යම් විමර්ශනයක දී යම් පොලිස් නිලධරයකුට සහාය වීම සඳහා (මෙහි මින්මතු "විශේෂඥයා" යනුවෙන් සඳහන් කරනු ලබන) (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි තොරතුරු තාක්ෂණය

ක්ෂේත්‍රයේ සුදුසුකම් සහ පළපුරුද්ද සහිත තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද විශේෂඥයකුගේ තොරතුරු තාක්ෂණය ක්ෂේත්‍රයේ සුදුසුකම් සහ පළපුරුද්ද සහ පත් කරනු ලබන ආකාරය සහ ක්‍රමය සහ එකී විශේෂඥයා පත් කිරීමේ කොන්දේසි, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලබන පරිදි විය යුතු ය.

(3) මේ පනත යටතේ වන විමර්ශනයක කාර්යය සඳහා, යම් විමර්ශනයක දී යම් පොලිස් නිලධරයකුට සහාය වීම සඳහා කැඳවනු ලබන යම් විශේෂඥයකුට, පොලිස් නිලධරයාගේ බලය යටතේ-

(අ) උප පොලිස් පරීක්ෂක නිලයට වඩා අඩු නොවන නිලයක පොලිස් නිලධරයකු සමඟ යම් පරිශ්‍රයකට ඇතුළු වීමට;

(ආ) යම් තොරතුරු පද්ධතියකට, පරිගණකයකට හෝ පරිගණක පද්ධතියකට නැතහොත් එම පරිගණකයේ ඇති යම් වැඩසටහනකට, දත්තවලට හෝ තොරතුරුවලට ප්‍රවේශ වීමට සහ යම් පරිගණකයකට යම් කාර්යයක් කිරීමට සැලැස්වීමට හෝ එවැනි වෙනත් යම් දෙයක් කිරීමට;

(ඇ) එම විමර්ශනයේ කාර්යය සඳහා අවශ්‍ය වන යම් ලේඛනයක්, තොරතුරක්, උපාංගයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට;

(ඈ) යම් හුවමාරුවන දත්ත හෙළිදරව් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට; සහ

(ඉ) යම් තැනැත්තකුගෙන් වාචිකව ප්‍රශ්න කිරීමට,

බලය තිබිය යුතු ය.

(4) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් විශේෂඥයාට ගෙවනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ පත් කරනු ලබන විශේෂඥයකු, මේ පනත යටතේ වන වරදක් විමර්ශනය කිරීමේ දී යම් පොලිස් නිලධරයකුට සහාය වීම සඳහා කැඳවනු ලැබිය හැකි අතර ඒ විමර්ශනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි සියලු සහාය ලබා දීම ඒ විශේෂඥයාගේ කාර්ය භාරය විය යුතු ය.

(6) මේ පනත යටතේ වන වරදක් සම්බන්ධ විමර්ශනයක දී අනාවරණය කර ගත් කරුණු අනුව යම් නඩු කටයුත්තක් ආරම්භකර ඇති අවස්ථාවක දී -

(අ) එකී නඩු කටයුත්තේ දී සාක්ෂි ලබා දීම සඳහා කැඳවනු ලබන්නේ නම්, එසේ සිදු කිරීම සඳහා; සහ

(ආ) එකී නඩු කටයුත්තේ කාර්ය සඳහා, එම විමර්ශනය අතරතුර දී විශේෂඥයා විසින් ලබාගත් යම් තොරතුරු, දත්ත, ද්‍රව්‍ය හෝ වෙනත් දෙයක් ලබා දීම,

විශේෂඥයාගේ කාර්යය විය යුතු ය.

විමර්ශනයක් සඳහා සහාය වීමේ කාර්යභාරය

**9.** (1) විශේෂඥයකු හෝ පොලිස් නිලධරයකු විසින්, මේ පනත යටතේ වන විමර්ශනයකට අදාළව යම් හෙළිදරව් කිරීමක් සිදු කරන ලෙස හෝ මේ පනත යටතේ වන විමර්ශනයක දී සහයෝගය දක්වන ලෙස නියම කරනු ලබන යම් තැනැත්තකු විසින් එම නියම කිරීමට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) විශේෂඥයකු හෝ පොලිස් නිලධරයකු වෙත පවරා ඇති බලතල නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමට බාධා කරන හෝ විමර්ශනයක් අතරතුර දී විශේෂඥයකු විසින් හෝ පොලිස් නිලධරයකු විසින් කරන ලද ඉල්ලීමකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත්වන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර එසේ වරදකරු කරනු ලැබූ විට, වසරකට නොඅඩු සහ වසර දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

සාක්ෂි

**10.** (1) මේ පනතේ විෂය පථය යටතට ගැනෙන, ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදු කරන ලද වරදකට අදාළ යම් සටහනක සහතික කළ පිටපතක්, මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් වන නඩු කටයුත්තකට අදාළව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරගනු ලැබිය යුතු අතර, එය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(2) යම් ලේඛනයක්, වාර්තාවක්, නාමලේඛනයක් හෝ එහි උද්ධෘතයක්, යම් විශේෂඥයකු විසින් යථා පරිදි අත්සන් කර නිකුත් කරනු ලැබ ඇත්නම් සහ එම ලේඛනය, වාර්තාව හෝ නාමලේඛනය හෝ එහි උද්ධෘතය අදාළ වන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද එම තැනැත්තා විසින් ඒවා යථා පරිදි සැබෑ බවට සහතික කර ඇත්නම්, එවැනි සෑම ලේඛනයක් ම, වාර්තාවක් ම, ලේඛනයක් ම හෝ එහි සෑම උද්ධෘතයක් ම එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(3) මේ පනත යටතේ වන යම් නඩු කටයුත්තක දී, අවස්ථාවෝචිත පරිදි, විශේෂඥයකු හෝ පොලිස් නිලධරයකු විසින් යථා පරිදි අත්සන් කර සහතික කරන ලද යම් ලේඛනයක් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරගනු ලැබිය යුතු වන අතර, එම ලේඛනය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(4) (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ වගන්තියේ විධිවිධාන, මේ පනත යටතේ වූ වරදක් සඳහා නඩු පැවරීමේ දී ඒ සම්බන්ධයෙන් බලාත්මක සහ අදාළ විය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා-

"සහතික පිටපත" යන්නෙන්, යම් පිටපතක් සත්‍ය පිටපතක් බවට සහතික කරමින් ඒ ලේඛනය, සහතිකය, වාර්තාව හෝ නාමලේඛනය හෝ එහි උද්ධෘතය අදාළ වනුයේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා විසින් ඒ පිටපතේ පහත කෙළවරේ ලියන ලද සහතිකයක් සහිත සටහනක පිටපතක් අදහස් වන අතර එම සටහන යම් තොරතුරු පද්ධතියක හෝ පරිගණකයක ඉලෙක්ට්‍රොනික, චුම්භක, දෘශ්‍ය හෝ වෙනත් යම් ආකාරයකින් ගබඩා කර ඇත්නම්, එකී ලේඛනය, සහතිකය, වාර්තාව හෝ නාම ලේඛනය හෝ එහි උද්ධෘතය අදාළ වනුයේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද ඒ සටහනේ මුද්‍රිත පිටපතක් අදහස් වේ; සහ

"ලේඛනය" යන්නට, සහතිකයක්, ප්‍රකාශයක්, තොරතුරක්, දත්ත, වාර්තාවක් හෝ ඒ හා සමාන වෙනත් යම් ලේඛනයක් ඇතුළත් වේ.

VI වන කොටස

**සාමාන්‍ය**

පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වැරදි

**11.** මේ පනත යටතේ වන වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක දී -

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු සහ නිලධරයකු ම; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් නම්, ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවෙකු ම,

ඒ වරද සිදු කරන ලද බවට සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු නැතහොත් ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු තම අනුදැනුමකින් තොරව ඒ වරද සිදු කරනු ලැබූ බවට හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා නිසි උද්යෝගයෙන් ක්‍රියාකළ බවට ඔප්පු කරන්නේ නම්, ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ හවුල්කරු ඒ වරද සිදු කරන ලද බවට සලකනු නොලැබිය යුතු ය.

වන්දි

**12.** යම් තැනැත්තකු මේ පනත යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබ ඇත්නම් සහ ඒ තැනැත්තා වරදකරු කරනු ලැබුවේ යම් අසභ්‍ය වූ ද්‍රව්‍යයක්, වස්තුවක් හෝ දෙයක් සම්බන්ධයෙන් ද එම අසභ්‍ය වූ ද්‍රව්‍ය, වස්තුව හෝ දෙය මගින් ළමයකු දෘශ්‍යමානව පෙන්නුම් කරනු ලබන අවස්ථාවක දී, අධිකරණය විසින්, ඒ ළමයාගේ අනන්‍යතාව නිශ්චය කරගනු ලැබිය හැකි නම්, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ගෙවනු ලබන යම් වන්දියකට සහ මේ පනත යටතේ පනවනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට අමතරව ඒ ළමයාට වන්දි ගෙවන ලෙස නියම කරනු ලැබිය යුතු ය.

පූර්ව නිගමන

**13.** (අ) මේ පනත යටතේ සිදු කරන ලද වරදකට අදාළව ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් හෝ එසේ නොවන මාධ්‍යයකින් පවතින යම් ලේඛනයක, සහතිකයක, වාර්තාවක හෝ නාමලේඛනයක හෝ එහි උද්ධෘතයක;

(ආ) විමර්ශන අතරතුර දී පොලිස් නිලධරයකු විසින් තහනමට ගනු ලබන පින්තූර සඟරා ඇතුළු සියලු දේපළවල; හෝ

(ඇ) ඉහත නිශ්චිතව දක්වා ඇති වැරදි සිදු කිරීමේ දී භාවිත කරන ලද යම් උපකරණයක,

සන්තකය, පාලනය හෝ භාරකාරත්වය දරන යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ වූ වරදක් සිදු කිරීමේ කාර්යය සඳහා හෝ ඒ සම්බන්ධයෙන්, ඒ ලේඛනය, සහතිකය, වාර්තාව, නාමලේඛනය හෝ එහි උද්ධෘතය හෝ ඒ දේපළ හෝ උපකරණය භාවිත කරනු ලැබ ඇති බවට එයට පටහැනිව කරුණු ඔප්පු කරන තෙක්, පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.

**දේපළ**

**14.** අධිකරණය විසින් අන්‍යාකාරයෙන් විධාන කරනු ලැබුවහොත් මිස, විමර්ශන අතරතුර දී පොලිස් නිලධරයකු විසින් තහනමට ගනු ලබන මුදල් ඇතුළු සියලු දේපළ, ඒ දේපළ සම්බන්ධයෙන් තම නීත්‍යනුකූල අයිතිය තහවුරු කරන තැනැත්තා වෙත ආපසු ලබා දෙනු ලැබිය යුතු ය.

**උදර්පන පනතට අදාළ අර්ථ නිරූපණය**

**15.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ කුමක් සඳහන් වුව ද, මේ පනත ප්‍රකාරව වූ යම් වරදක්, ඒ පනත යටතේ උදර්පනය කිරීමේ කාර්යය සඳහා පමණක් මූල්‍ය වරදක් හෝ දේශපාලන ස්වභාවයේ වරදක් හෝ දේශපාලන වරදකට සම්බන්ධ වරදක් හෝ දේශපාලන අරමුණු මගින් පොළඹවන ලද වරදක් වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

**ඉල්ලීම කරනු ලබන රාජ්‍යයට දැනුම් දීමට අමාත්‍යවරයා සතු කාර්යභාරය**

**16.** මේ පනත යටතේ වූ වරදකට චෝදනා ලැබ සිටින හෝ වරදකරු කරනු ලැබ සිටින යම් තැනැත්තකු උදර්පනය කිරීම සඳහා වෙනත් රටක ආණ්ඩුවක් විසින් හෝ වෙනත් රටක ආණ්ඩුවක් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙත ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක දී, විදේශ කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින්, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන්, ඒ වරද වෙනුවෙන් ඒ තැනැත්තාට එරෙහිව නඩු පැවරීම සඳහා හෝ ඒ තැනැත්තා උදර්පනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගෙන ඇති හෝ ගැනීමට යෝජිත පියවර පිළිබඳව ඉල්ලීම කරනු ලබන රාජ්‍යයේ ආණ්ඩුව වෙත නොපමාව දැනුම් දෙනු ලැබිය යුතු ය.

රටවල් සහ සංවිධානවලට සහාය ලබාදීම

**17.** මේ පනත යටතේ වූ වරදක් විමර්ශනය කිරීම සඳහා සහ ඒ සඳහා නඩු පැවරීම සඳහා අවශ්‍ය වන කවර හෝ අවස්ථාවක දී, 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ විධිවිධාන, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ ඉහත කී පනතේ 2 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියමයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන නිශ්චිත රටක් හෝ නිශ්චිත සංවිධානයක් අතර සහාය ලබාදීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මේ පනත යටතේ සිරභාරයට ගනු ලබන තැනැත්තන්ගේ අයිතිවාසිකම්

**18.** (1) මේ පනත යටතේ වූ වරදක් සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු සිරභාරයට ගනු ලැබූ අවස්ථාවක දී -

(අ) ඔහු ජාතිකත්වය දරන රාජ්‍යයේ හෝ වෙනත් ආකාරයකින් ඔහුගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හිමිකම ඇති රාජ්‍යයේ ආසන්නත ම නිසි නියෝජිතයා සමග හෝ ඔහු අදේශික තැනැත්තකු නම් ඔහු සාමාන්‍යයෙන් වාසය කරන රාජ්‍යයේ ආසන්නත ම නිසි නියෝජිතයා සමග අප්‍රමාදව සන්නිවේදනය කිරීමට; සහ

(ආ) ඒ රාජ්‍යයේ නියෝජිතයකු විසින් ඔහු හමුවීමට පැමිණීමට,

ඒ තැනැත්තාට හිමිකම් තිබිය යුතු ය.

(2) 16 වන වගන්තිය යටතේ වන ඉල්ලීමක්, නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි ඒ විධිවිධාන අනුව ප්‍රමාණවත් පරිදි අනුකූලව ක්‍රියාකර ඇත්නම්, 17 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීමක් හේතුවෙන් 16 වන වගන්තිය යටතේ වන ඒ ඉල්ලීම යම් නීති කෘත්‍යයක කාර්ය සඳහා අවලංගු වී නොමැති බවට සලකනු ලැබිය යුතු ය.

වරදක් පිළිබඳව අධිකරණ බලය ඇති වෙනත් රාජ්‍යවලට දැනුම්දීමට අමාත්‍යවරයාට ඇති කාර්යභාරය

**19.** (1) මේ පනත යටතේ වූ වරදක් සඳහා යම් තැනැත්තකු සිරභාරයට ගනු ලැබ ඇති අවස්ථාවකදී, ඒ තැනැත්තාට එරෙහිව නඩු පැවරීම සඳහා හෝ ඒ තැනැත්තා උද්ර්පනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගනු ලැබ ඇති හෝ ගැනීමට යෝජිත පියවර පිළිබඳව ඒ තැනැත්තා සම්බන්ධයෙන් 16 වන වගන්තිය යටතේ ඉල්ලීමක් කර ඇති වෙනත් යම් රාජ්‍යයක අදාළ බලධාරීන් වෙත දැනුම් දීම සඳහා මේ පනතේ පරිපාලනය පවරා ඇති අමාත්‍යවරයා විසින් විදේශ කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයා වෙත දැනුම් දිය යුතු ය.

(2) මේ පනත යටතේ වූ වරදකට අනුරූප වරදක් සඳහා චෝදනා ලැබ සිටින හෝ වරදකරු කරනු ලැබ සිටින යම් තැනැත්තෙක් උදර්පනය කිරීම සඳහා, යම් රාජ්‍යයක ආණ්ඩුවක් විසින්, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනත යටතේ කරන ලද ඉල්ලීමක් ප්‍රකාර, ඒ තැනැත්තා උදර්පනය කිරීම සඳහා ඒ පනත යටතේ නියමයක් නොකළ යුතු බවට තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක දී, ශ්‍රී ලංකාවේ නීතිය යටතේ ඒ වරද සඳහා නඩු පැවරීම සඳහා හෝ වෙනත් යම් නිසි ක්‍රියාමාර්ගයක් සලකා බැලීම සඳහා ඒ කාරණය නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

උදර්පන වැඩපිළිවෙළ සම්බන්ධයෙන් වන විධිවිධාන

**20.** ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ වෙනත් යම් රාජ්‍යයක ආණ්ඩුවක් අතර උදර්පන වැඩපිළිවෙලක් බලාත්මකව පවතින අවස්ථාවක දී, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ කාර්ය සඳහා එම වැඩපිළිවෙලට මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් සහ එවැනි වරදක් සිදු කිරීමට තැත් කිරීම හෝ කුමන්ත්‍රණය කිරීම හෝ එවැනි වරදක් සිදු කිරීමට ආධාර හෝ අනුබල දීම සම්බන්ධයෙන් උදර්පනය කිරීම සඳහා වූ විධිවිධාන ද ඇතුළත් වන බවට සලකනු ලැබිය යුතු ය.

වෙනත් රාජ්‍යවලට සහාය ලබා දීමට ආණ්ඩුවට ඇති කාර්යභාරය

**21.** මේ පනත යටතේ වූ වරදකට අනුරූප වන, යම් රාජ්‍යයක නීතිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට එරෙහිව ඒ රාජ්‍යයේ පවරා ඇති අපරාධ නඩු කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි (එය සතුව ඇති යම් අදාළ සාක්ෂි සැපයීම ද ඇතුළුව) එවැනි යම් සහායක් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඒ විදේශ රාජ්‍යයේ අදාළ බලධාරීන් වෙත ලබා දෙනු ලැබිය යුතු ය.

මහාධිකරණයට අධිකරණ බලය තිබිය යුතු බව

**22.** 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වූ සෑම වරදක් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබුවා වූ කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී නඩු විභාග කරනු ලැබිය යුතු ය.

නඩු කටයුතුවලින් ආරක්ෂාව

**23.** (1) මේ පනත මගින් හෝ මේ පනත යටතේ පවරන ලද බලතල ප්‍රකාරව හෝ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් විශේෂඥයකු හෝ පොලිස් නිලධරයකු යම් නඩු කටයුත්තක දී හෝ වෙනත් නීති කෘත්‍යයක දී වගකීමට යටත් නොවිය යුතු ය.

(2) මේ පනත යටතේ විශේෂඥයකු හෝ පොලිස් නිලධරයකු විසින් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව අධිකරණයක පවරන ලද යම් නඩු කටයුත්තක දී හෝ වෙනත් නීති කෘත්‍යයක දී ඒ විශේෂඥයා හෝ පොලිස් නිලධරයා විසින් දරන ලද යම් වියදම්, ඒ ක්‍රියාව සද්භාවයෙන් සිදු කරනු ලැබූ බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, ඔහු විසින් ඒ වියදම ඒ නඩු කටයුත්තේ දී හෝ වෙනත් නීති කෘත්‍යයේ දී ආපසු අයකර ගෙන ඇත්නම් මිස, යම් වැරදි සහගත ක්‍රියාවක් සිදු කිරීම පිළිබඳව ඒ විශේෂඥයාට හෝ පොලිස් නිලධරයාට විරුද්ධව චෝදනා කරන තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු ය.

ළමයින් සම්බන්ධ වරදක් සඳහා වන දඬුවම

**24.** මේ පනතේ 3 වන වගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීම සඳහා ළමයකු භාවිතා කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, එසේ වරදකරු කරනු ලැබූ විට, වසර දෙකකට නොඅඩු සහ වසර දහයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ දෙකකට නොඅඩු සහ රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු අතර, දෙවන වරට හෝ තදනන්තරව වරදකරු කරනු ලැබූ විට, වසර දෙකකට නොඅඩු කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ තුනකට නොඅඩු සහ රුපියල් මිලියන පහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

ළමා වරදකරුවන් සඳහා අඩු දඬුවම්

**25.** මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් ළමයකු වරදකරු වූ විට, මෙහි විධිවිධාන සලස්වා ඇති දඬුවමට වඩා අඩු දඬුවමක් අධිකරණය විසින් පනවනු ලැබිය හැකි ය.

වරදක් සිදු කිරීමට තැත් කිරීම වරදක් බව

**26.** මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමට තැත් කරන යම් තැනැත්තෙක් වරදක් සිදු කරන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී, එක් එක් වරදක් සඳහා විධිවිධාන සලස්වා ඇති උපරිම කාලයෙන් හරි අඩක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම වරද සඳහා විධිවිධාන සලස්වා ඇති අවම දඩ මුදලින් හරි අඩකට නොඅඩු දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

වරදකට අනුබල දීම වරදක් බව

**27.** (1) මේ පනත යටතේ වූ වරදක් සිදු කිරීමට අනුබල දෙන යම් තැනැත්තකු අනුබල දීමේ වරද සිදු කරන අතර මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී-

(අ) අනුබල දීමේ ප්‍රතිඵලයක් ලෙස අනුබල දෙන ලද වරද සිදුකරනු ලැබ ඇත්නම්, ඒ වරද සඳහා විධිවිධාන සලස්වා ඇති දඬුවමට ම යටත් විය යුතු ය; සහ

(ආ) අනුබල දීමේ ප්‍රතිඵලයක් ලෙස වරද සිදු කර නොමැති නම්, ඒ වරද සඳහා විධිවිධාන සලස්වා ඇති උපරිම කාලයෙන් හතරෙන් එකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ වරද සඳහා විධිවිධාන සලස්වා ඇති අවම දඩ මුදලින් හතරෙන් එකකට නොඅඩු දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) "අනුබල දීම" යන යෙදුමට (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 100 වන සහ 101 වන වගන්තිවල ඇති අර්ථය ම තිබිය යුතු අතර දණ්ඩ නීති සංග්‍රහයේ 101අ වන, 103 වන, 104 වන, 105 වන, 106 වන සහ 107 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනත යටතේ වූ වරදකට අනුබල දීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීම

**28.** (1) මේ පනත යටතේ වූ වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, මහාධිකරණ විසින් වරදකරු කරනු ලැබීමේ දී එම වරද සිදු කිරීමට අනුබල දීම සඳහා නියම කර ඇති දඬුවමෙන් දඬුවම් කරනු ලැබීමට යටත් විය යුතු ය.

(2) "කුමන්ත්‍රණය කිරීම" යන යෙදුමට (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 113අ වන වගන්තියේ (2) වන උපවගන්තියේ ඇති අර්ථය ම තිබිය යුතු අතර, එම වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීමක් සහිතව, මේ පනත යටතේ වූ වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් අදාළ කර ගනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ වූ වැරදි, සංඥෙය වැරදි බව සහ ඇප දිය නොහැකි වැරදි බව

**29.** මේ පනත යටතේ වූ සෑම වරදක් ම-

(අ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සංඥෙය වරදක් විය යුතු ය; සහ

(ආ) 1997 අංක 30 දරන ඇප පනතේ අර්ථානුකූලව ඇප දිය නොහැකි වරදක් විය යුතු ය.

අසභ්‍ය ද්‍රව්‍ය ආදිය විනාශ කිරීම සඳහා වන ආඥා

**30.** (1) මේ පනත යටතේ වූ වරදක් සඳහා යම් තැනැත්තකු පිළිබඳ නඩු විභාගය අවසන් වීමේ දී සහ එම තැනැත්තා වරදකරු කරනු ලැබුව ද එසේ කරනු නොලැබුව ද, වරදේ විෂය වස්තුව සංස්ථාපනය කරන ද්‍රව්‍ය, වස්තුව හෝ දෙය අසභ්‍ය බවට අධිකරණයේ මතය වන්නේ නම්, අධිකරණය විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකට එම ද්‍රව්‍ය, වස්තුව හෝ දෙය විනාශ කිරීම සඳහා නියම කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ වූ වරදක් සඳහා යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමේ දී, එම වරද සිදු කිරීම සඳහා භාවිත කරන ලද යම් චංචල දේපළක් පිළිබඳව සද්භාවයෙන් යුක්ත වූ අයිතියක් තිබිය හැකි යම් තැනැත්තකුගේ හිමිකම්පෑමකට යටත්ව, එම චංචල දේපළ රාජසන්තක කිරීම සඳහා අධිකරණය විසින් නියම කරනු ලැබිය යුතු ය.

අසභ්‍ය ප්‍රකාශන ආඥාපනත ඉවත් කිරීම

**31.** (30 වන අධිකාරය වූ) අසභ්‍ය ප්‍රකාශන ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ.

අර්ථ නිරූපණ

**32.** මේ පනතේ -

"ළමයා" යන්නෙන්, වයස අවුරුදු දහ අටකට අඩු තැනැත්තකු අදහස් වේ;

"ද්‍රව්‍ය, වස්තුව හෝ දෙය" යන්නට, යම් ලියවිල්ලක්, චිත්‍රයක්, මුද්‍රණයක්, සිතුවමක්, මුද්‍රිත ද්‍රව්‍යයක්, පින්තූරයක්, පෝස්ටරයක්, ලාංඡනයක්, ඡායාරූපයක්, සිනමාරූපී සේයා පටයක්, සේයා පටයක් හෝ යම් මාධ්‍යයක ඇති යම් දත්ත ඇතුළත් වේ; සහ

"අසභ්‍ය" යන්නට, යම් සාධාරණ තැනැත්තකුගේ මනස කෙලෙසීම හෝ දූෂණය කිරීම එමගින් ම සිදු කිරීම සඳහා ප්‍රමාණවත් වන යම් ද්‍රව්‍යයක්, වස්තුවක් හෝ දෙයක් හෝ ඒ ද්‍රව්‍ය, වස්තුව හෝ දෙය එකිනෙකට

වෙනස් කොටස් එකකට වඩා වැඩි ප්‍රමාණයකින් සමන්විත වන අවස්ථාවක දී, ඒ එක් එක් කොටස මගින් එසේ කෙලෙසීම හෝ දූෂණය කිරීම සඳහා ප්‍රමාණවත් වන, ද්‍රව්‍යයක්, වස්තුවක් හෝ දෙයක් ඇතුළත් වන අතර එයට විද්‍යාවේ, සාහිත්‍යයේ, කලාවේ, අධ්‍යාපනයේ හෝ ඉගෙනීමේ යහපත වෙනුවෙන් සිදු කරන ලද යම් දෙයක් ඇතුළත් යම් ද්‍රව්‍යයක්, වස්තුවක් හෝ දෙයක් ඇතුළත් නොවේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**33.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.